## සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2014

---------------------------------------------------------

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරීමේ සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ 10 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

උත්තරීත්තර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 ආයතනය පිහිටුවීම

-----------------------

2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත 2014 අප්‍රේල් 24 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මතකර තිබුණද අරමුදලේ මෙහෙයුම් කටයුතු සමාලෝචිත වර්ෂය පුරාම ශාසනාරක්ෂක මණ්ඩලය යටතේ පැවතුණි. 2014 අංක 16 දරන ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල පනතේ 5 ඡේදය පරිදි අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළත් විධායක කමිටුවක් අවුරුදු තුනක කාලයක් සඳහා තෝරා පත්කරගත යුතු අතර අරමුදලේ පළමු විධායක සභාවට දිස්ත්‍රික්ක 24 නියෝජනය වන පරිදි බෞද්ධ ස්වාමීන් වහන්සේලා 24 දෙනෙකු පත්කර තිබුණි.

### 1.5 මතය ව්‍යාචනය සඳහා පදනම

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ, ආදායම් වියදම් ගිණුමේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට ආදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය ව්‍යාචනය

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---------------------------

මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ දී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය අනුව මුදල් හා මුදල්වලට සමාන දෑ රු.9,349,248 ක් වූවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව එදිනට මුදල් ශේෂය රු.1,158,685 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ජංගම ගිණුමේ ශේෂය රු.514,101 ක් වූවද අවසන් ගිණුම අනුව එම ශේෂය රු.203,785කි. එනමුත් ජංගම ගිණුම වෙනුවෙන් අරමුදල විසින් මුදල් පොතක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර බැංකු සැසඳුම් ප්‍රකාශනද පිළියෙල කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------------

2014 දහම් පාසල් කොඩි අලෙවි වාර්තාව අනුව වටිනාකම රු.20,470,415 ක්වූ කොඩි 1,897,579 ක් දිස්ත්‍රික්ක 20 ක ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 289 ක් අතර බෙදාහැර තිබුණ ද මුද්‍රිත ටිකට්පත් ප්‍රමාණය, අලෙවි නොවී ඉතිරි වූ ටිකට් පත් ප්‍රමාණය හා එම ඉතිරි ටිකට් පත් ප්‍රමාණය ඇති ස්ථානය හෝ තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් මුළු ආදායමෙන් සියයට 80 ක් පමණ වූ රු.6,095,980 ක කොඩි අලෙවි ආදායම විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි වීමෙන් ආදායමේ නිවැරදිතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව තහවුරු කරගැනීමට නොහැකි විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2005 දෙසැම්බර් 19 දිනැති හා අංක පීඊඩී 33 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල ආයෝජන රාජ්‍ය බැංකුවල පමණක් සිදුකළ යුතු වුවත්, ආයතනය විසින් දිගු කාලයක සිට රු.5,495,000 ක් පෞද්ගලික බැංකුවක ස්ථිර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 257 | අවස්ථා 12 කදී එකතුව රු.770,000 ක්වූ මුදලක් අදාළ ගෙවීම් වවුචර් සහතික කිරීමෙන් තොරව ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම සහ වියදම පිළිවෙළින් රු.7,658,514ක් හා රු.6,499,829ක් වූයෙන් එහි මෙහෙයුම් කටයුතුවල අතිරික්තය රු. 1,158,685 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පනතේ 3 වන වගන්තියට අනුව සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ පොදු පරමාර්ථ පහත සඳහන් වේ.

- බුද්ධශාසනයේ සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම උදෙසා සහ භික්ෂු සමාජයේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා පියවර ගැනීමට අදාළ අධිකාරීන් වෙත සහාය දීම.

- දුර බැහැර ප්‍රදේශ වල පිහිටා ඇති බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය හා පුනරුත්ථාපනය, ප්‍රවර්ධනය, බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා ගිහි බෞද්ධ ජනතාව අතර, මිත්‍රශීලී බැඳීම ඇති කිරීම තහවුරු කිරීම සඳහා අදාළ අධිකාරීන් වෙත සහාය දීම.

- "දහම් පාසල් අධ්‍යාපනය" දියුණු කිරීම සඳහා සහ දහම්පාසල් වල ආචාර්යවරුන් හා ශිෂ්‍යයන්ගේ සුබසාධනය උදෙසා ක්‍රියා කරනු ලැබීමට අදාළ අධිකාරීන් වෙත සහාය වීම.

- බාහිර බලපෑම් වලින් බෞද්ධ පාරම්පරික උරුමයන් ආරක්ෂා කිරීම හා එම උරුමයන් වැඩි දියුණු කිරීම, බෞද්ධ ධර්මය අදහන තැනැත්තන් අතර බෞද්ධ සිරිත් විරිත් ප්‍රචාරය කිරීම සහ ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම පිණිස අදාළ අධිකාරීන් වෙත සහාය දීම.

- අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම පිණිස, දිස්ත්‍රික්ක හා පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන අරමුදලේ ශාඛා වලට මඟ පෙන්වා ඒවා අධීක්ෂණය කිරීම හා ඒවා සම්බන්ධීකරණය කිරීම.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේ දී සිසු සවිය ශිෂ්‍යත්ව සඳහා රු.1,136,500 ක් ද, වෛද්‍යාධාර සඳහා එක් අයෙකුට රු. 1,000 බැගින් රු.319,000 ක් ද, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දී තිබුණ නමුත් එම මුදල් ලැබිය යුතු පුද්ගලයන්ට ලැබුනේද යන්න පිළිබඳ ශාසනාරක්ෂක බල මණ්ඩල විසින් පසු විපරම් කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 මැයි 15 දිනදීය.

**5.2 ක්‍රියාකාරි සැලැස්ම**

-------------------

පනතේ සඳහන් අරමුණු ලඟාකරගත හැකි වන ආකාරයට වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති, අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය අනුව අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එසේ සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබදව වරින් වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) අරමුදල විසින් මුද්‍රණය කර අලෙවි කරනු ලබන ස්ටිකර්වල ආදායම හා වියදම පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ගිණුම් පවත්වා නොතිබීම. |
| | (ii) ලෙජර් ගිණුම් පැහැදිලිව, නිවැරදිව හා විධිමත්ව පවත්වා නොතිබීම. |
| | (iii) ජංගම ගිණුමෙන් කරන ලද වියදම් සඳහා මුදල් පොතක් භාවිතා නොකිරීම හා විධිමත්ව වවුචර් පිළියෙල කර නොතිබීම. |
| | (iv) ආදායම් සඳහා ලදුපත් නිකුත් කර නොතිබීම. |
| (ආ) ස්ටිකර් මුද්‍රණය හා අලෙවිය | මුද්‍රණය කරන ලද ස්ටිකර් සඳහා අනු අංක යොදා නොතිබීම හා, නොවිකිණි ඉතිරි වූ ස්ටිකර් ආපසු භාර ගැනීම හා වාර්තා තබාගැනීම යනාදිය සිදු නොකිරීම. |